**ශීර්ෂ 179 - වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

## 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| ----- | ---------------------------------- | ------------------------- |
| 179 | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 2015 ජුලි 29 දින |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2015 ජුලි 16 දින |

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,569.3 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,343.7 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 5.5 ක් හා රු.මිලියන 220.1 ක් හෙවත් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 5 ක් හා සියයට 15 ක් වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 179 | 105.7 | 100.2 | 5.5 | 5.20 |
| 284 | 1,463.6 | 1,243.5 | 220.1 | 15.04 |
| එකතුව | **1,569.3** | **1,343.7** | **225.6** | **14.38** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2014 වර්ෂයට 20.03.02.06 දරන ආදායම් සංකේතය යටතේ රු.මිලියන 17 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 17.03 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 100.1 ක ප්‍රමාණයක ආදායම් රැස්කර තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17901 | 4.0 | 3.4 | 1.8 | 3.2 | 30.0 | 9.0 |
| 28401 | 40.0 | 36.5 | 28.0 | 32.4 | 135.0 | 132.1 |

## 2.4 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල ශේෂ එකතුව රු.674,418 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 7002/0000/00/0418/0014/000 | 29,000 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0145/0014/000 | 645,418 |
| එකතුව | | 674,418 |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.171,271,425 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **තැන්පත් ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | **රු.** |
| වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0188/000 | 613,270 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0139/000 | 170,658,155 |
| **එකතුව** | | **171,271,425** |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. **ශීර්ෂ 179 -** වනජීවි සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | හානි පිළිබඳ ලේඛනය. | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (iii) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| (iv) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

**3.2 අධිවැය**

--------

විධිමත් අනුමැතියකින් තොරව වැය විෂයයන් 12 ක ප්‍රතිපාදන ඉක්මවා, එකතුව රු.1,288,869 ක් වැය කර තිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

-----------------

**අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් දෙකක් සඳහා සළසා තිබුණු රු.350,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 04 කට එකතුව රු.3,562,732 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 43 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4 අග්‍රිම ගිණුම්**

--------------

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දින සිට පැවත එමින් තිබුණු රු.29,000 ක අග්‍රිම ගිණුමේ ශේෂය 2014 දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**3.5.1 අභ්‍යන්තර විගණනය**

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

------------------------------------

2014 වර්ෂයේදී විගණන කළමනාකරන කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

--------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**--------------------------------------**

2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇති වත්කම්**

**---------------------------------------------**

2014 වර්ෂයේදී වනජීවි සම්පත් සංරක්ෂණ හිටපු අමාත්‍යවරයාට ලබා දී තිබුණු යුගල ඇඳන් 03 ක්, අල්මාරි 02 ක්, කෑම මේසය සමඟ පුටු 06 ක්, සෝපා කට්ටල 01 ක්, LCD රූපවාහිනි යන්ත්‍ර 01 ක්, වායු සමීකරණ යන්ත්‍ර 03 ක්, ලැප්ටොප් පරිගණක 02 ක්, ප්‍රින්ටර් 01 ක්, පාදස්තල විදුලි පංකා 02 ක්, පරිගණක කට්ටල 01 ක්, ඇතුළුව භාණ්ඩ අයිතම 46 ක් හිටපු අමාත්‍යවරයා විසින් 2015 අගෝස්තු 20 දින වන විටත් අමාත්‍යාංශය වෙත භාර දී නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**----------------------------------------------------------**

වටිනාකම විගණනයට ඉදිරිපත් නොවුනු ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් ද, අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මෝටර් රථ 04 ක් ද හා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති මෝටර් රථ දෙකක්ද පිළිවෙලින් 2013 ජනවාරි 28 දින හා 2013 මාර්තු 12 දින සිට 2014 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය භාවිතයට ගෙන තිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**--------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 104 හා 110 | - | මෝටර් රථ 04 ක මුල් වටිනාකම, හානිය සිදුවූ අවස්ථාවකදී ආසන්නතම අගය හා අළුත්වැඩියාවට යන වියදම හානි පාඩු ලේඛනයේ දක්වා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 105(1) හා (2) | - | අයකර ගැනීමට තීරණය කළ මුදල හා අයකර ගත හැකි උපරිම වටිනාකම හානි පිළිබඳ ලේඛනයේ දක්වා නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| | 2014 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන චක්‍රලේඛය | 750,000 | වාහනයකට මසකට ගෙවිය හැකි උපරිම කුලිය රු.40,000 ක් වුවද මාසයකට රු.250,000 බැගින් මාස 03 කට රු.750,000 ක් ගෙවා තිබුණි. |

## 3.8 කාර්යසාධනය

2014 වර්ෂය සඳහා වන කාර්යසාධන වාර්තාව 2015 අගෝස්තු 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික වාර්තාවේ තොරතුරුවලට අනුව අමාත්‍යාංශයේ කාර්යසාධනය සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වනජීවි සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ පාලන අංශයේ කාර්ය මණ්ඩල පුහුණුව යටතේ අපේක්ෂිත ඉලක්ක සඳහා දර්ශකය ලෙස වැඩසටහන් සංඛ්‍යාව දක්වා තිබුණද, ප්‍රගතිය පරික්ෂාවේදී වැඩ සටහන් සංඛ්‍යාව දක්වා නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් හා වැඩමුළු සඳහා රු.920,358 ක්

2014 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණද, වැඩමුළුවලට සහභාගී වූ නිලධාරීන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මේ 01 සිට 11 දක්වා මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වා නොතිබීම නිසා රු.2,437,042 ක වියදම් සම්බන්ධව එහි භෞතික කාර්යසාධනය සමඟ සැසඳිය නොහැකි විය.

(ඈ) ජාතික වනෝද්‍යාන තුළ සිදු කරන සංවර්ධන කටයුතු, විදුලි වැට ඉදි කිරීම, වන අලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදි කිරීම, වාසස්ථාන සුපෝෂණය (Habitat Enrichment) කිරීමට කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය වෙනුවෙන් භෞතික ඉලක්ක ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි.

(ඉ) 2014 වනජීවි භාරයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ක්‍රියාකාරකම් 06 ක් යටතේ දක්වා තිබුණු භෞතික ඉලක්ක සපුරාගෙන නොතිබුණි.

(ඊ) වනජීවි භාරයේ 2014 වර්ෂයට ආදායම් එකතු කිරීමේ සැලැස්මට අනුව රු.13,900,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එකතු කළ රු. 11,224,554 ක ආදායම ඒකාබද්ධ අරමුදලට බැර නොකර වනජීවී භාරයට බැර කර තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 10 | 01 | - |
| (ii) තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) ද්විතියික මට්ටම | 42 | 37 | 09 | 04 |
| (iv) වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්) | 25 | 24 | 01 | - |
| එකතුව | 81 | 73 | 12 | 04 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 12ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ii) ද්විතීයික මට්ටමේ තනතුරුවල 2014 දෙසැම්බර් 31 දිනට සිටි අතිරික්ත සේවකයින් 04 දෙනා සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂ 284 - වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 4.1 ගිණුම් ඉදිරිපත් කිරීම

විෂය අංක 28401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2015 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එම සැසඳුම් ප්‍රකාශය මාස 03 කට වැඩි කාල පමාවකින් පසුව 2015 ජුලි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 4.2 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි. |
| (ii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (iii) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය. | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | කම්ටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය. | වාර්තා පවත්වා නොතිබුණි. |
| (v) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

**4.3 අග්‍රිම ගිණුම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණු අග්‍රිම ගිණුමේ ශේෂය රු.49,559 ක් විය.

**4.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.31,286,218 ක තැන්පතු 61 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.5 ආදායම් ගිණුම්**

1958 අංක 29 දරන සත්ව පනත හා 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 අති විශේෂ ගැසට් පත්‍රය අනුව සතුන් ප්‍රවාහනය කිරීමේදී අයකරනු ලබන ගාස්තුව මෙම දෙපාර්තමේන්තුවේ ආදායමක් නොවුවද, සමාලෝචිත වර්ෂයේදී එකතු කළ රු.139,858 ක ලැබීම් දෙපාර්තමේන්තුවේ ආදායමක් ලෙස සළකා ගිණුම්ගත කර තිබුණි.

**4.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.3,791,586 ක හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) නිලධාරීන් 05 දෙනෙකුගේ එකතුව රු.559,120 ක්වූ ණය ශේෂ සැසඳුම් ප්‍රකාශයේ උපලේඛනයේ ඇතුළත් කර තිබුණද, සීසී 10 ලේඛනයේ එම ණය ඇතුළත් කර නොතිබුණි.

## 4.7 වත්කම් කළමනාකරණය

### නිෂ්ක්‍රීය වත්කම්

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී මෝටර් වාහන 21 ක් වසර 10 කට වැඩි කාලයක් මුළුල්ලේ නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.8 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 134 (3) | - | 2014 වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත 2015 අගෝස්තු 31 දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104(03) හා (04) | - | 2011 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ සිදු වී |

| | | |
|---|---|---|
| | | තිබුණු අලාභහානි සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් පවත්වා අලාභයේ වටිනාකම නිශ්චය කිරීමට කටයුතු නොකළ අවස්ථා 11 ක් පැවැතුණි. |
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක CA/1/17 දරන චක්‍රලේඛය | 100,000 | අලාභහානි කපාහැරීමේදී එම දේපලවල තක්සේරු වටිනාකම හෝ පිරිවැය යන දෙකෙන් වැඩි අගයට දෙපාර්තමේන්තුවේ අනුශාංගික වියදම්ද ඇතුළත්කර පිරිවැය තක්සේරු කළ යුතු වුවත් රු.100,000 ක් වූ එකී පිරිවැය නොසළකා තක්සේරු වටිනාකම රු.80,000 මත අලාභය අයකර ගැනීමට කටයුතු කර තිබුණි. |
| **(ඇ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** | | |
| 2014 ජනවාරි 01 දිනැති හා බීඩී/EBP/4/1/14/2014 දරන චක්‍රලේඛයේ 2.1.3 ඡේදය | 6,863,450 | ඉන්ධන, විදුලිය හා ජලය, ප්‍රවාහන වියදම් වාර්ෂික ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි කළමනාකරණය කරගත යුතු වුවත් එකී සීමාව ඉක්මවා 2014 වර්ෂයේදී වැය කර තිබුණි. |

**4.9** **කාර්යසාධනය**

---------------

**දෙපාර්තමේන්තුවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සිදු කළ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.**

**(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

---------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

(i). දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට අනුව මුළු ප්‍රතිපාදිත මුදල රු.මිලියන 216.887 ක් වූ කාර්යයන් 166 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii). වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ඉක්මවා ක්‍රියාකාරකම් 41 කට රු.මිලියන 556.957 ක් වැය කර තිබුණි.

(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). හොරොව්පතාන විදුලි වැට ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව ජාතික යන්ත්‍රෝපකරණ අධිකාරියේ ව්‍යාපෘති ඉංජිනේරු හා වනජීවි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2012 ජුනි 06 දින රු.189,538,263 ක වටිනාකමටකට ඉටු කිරිමට ගිවිසුම්වලට එළඹ තිබුණි. ගිවිසුම අනුව එහි කටයුතු 2012 ඔක්තෝබර් 30 දින අවසන් කළ යුතුව තිබුණත්, 2015 ජනවාරි මාසය වන විටත් නිම කර නොතිබුණි.

(ii). වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හොරොව්පතාන අලි රුඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේදී කිලෝ මීටර් 09 ක ඝන කැලය සහ කිලෝමීටර 07 මධ්‍යම ප්‍රමාණයක කැලෑ කපා ඉවත් කළ යුතුව තිබුණි. එම කැලෑ කපා ඉවත් කළ දැව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ගත් ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. උක්ත අලිවැට ඉදි කිරීමේදී රු.72,817,562 ක් රාජ්‍ය සංස්ථාවකට වැඩිපුර ගෙවීමට කටයුතු කර තිබුණි.

(iii). ඉහත සඳහන් ගිවිසුමේ 5 වන වගන්තිය ප්‍රකාරව සුසුදුකම්ලත් ඉංජිනේරු වරයෙකුගේ/ කාර්මික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ විදුලි වැට ඉදිකිරීම සිදුවිය යුතු වුවද, 2015 අප්‍රේල් 23 දින විගණනය විසින් වැඩ බිමේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී ඉහත සඳහන් නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් සිදු කර නොතිබුණු බව අනාවරණය විය. එමෙන්ම ඒ සඳහා යොදා තිබුණු කොන්ක්‍රීට් කණුද ගුණාත්මක බවින් තොරවිය.

(iv). මෙම අලි රැදවුම් මධ්‍යස්ථානය තුළ වැව් 03 ක් ප්‍රතිසංස්කරණය කිරීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පිළියෙල කළ රු.11,364,945 ක ඇස්තමේන්තු පදනම් කරගෙන එම වැව් 03 අලුත්වැඩියා කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව කටයුතු කරමින් කොන්ත්‍රාත්කරුට රු.8,417,314 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(v). අලි වැට වටා මාර්ගයේ සපත්තු පාලම් ඉදි කිරීම සම්බන්ධයෙන් සිදු කළ සෝදිසි විගණන පරීක්ෂාවේදී ප්‍රමිතියෙන් බැහැරව ඉටු කර තිබුණු වැඩ සඳහා රු.1,666,509 ක් ගෙවා තිබුණි. එමෙන්ම ගිවිසුමේ සඳහන් පරිදි ප්‍රමාණ කළ අලාභ ලෙස දින 240 කට අය කළ යුතු රු.783,887 ක්ද කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. වැඩ අවසන් කර භාර දිය යුතු පාලම් 77 න් 44 ක වැඩ නිම කිරීම වෙනුවෙන් රු.14,318,712 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද පාලම් 33ක්ම ඉදි කර නොතිබූණු බව 2015 අප්‍රේල් 23 දින විගණනය විසින් කළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(vi). වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 469 අධිකාරිය හා 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ (සංශෝධන) පනත මගින් ජීවීන් ආරක්ෂා කිරීම අපේක්ෂා කර තිබුණි. උක්ත අලි රැදවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේදී අලිවැට අලින් විසින් කඩා බිඳ දැමීම වැලැක්වීමට විශේෂයෙන් නිර්මාණය කළ කණුවල දෙපස උල් යෙදීම නිසා සහ කණු යා කිරීමට යකඩ කම්බි පොට 3 ක් යෙදීම නිසා අලින්ට තුවාල සිදුවන බව නිරීක්ෂණය විය.

## 4.10 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අය කර ගැනීමේ හැකියාවක් නොතිබුණු අවස්ථා 29 කට අදාළ වසර 10 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණු එකතුව රු.3,541,961 ක හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 108 ප්‍රකාරව බලයලත් නිලධාරියෙකු මගින් අත්හැර දැමීමේ නියෝගයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.11 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකර තිබුණු පහත සඳහන් විගණන ඡේදවලින් පෙන්වා දුන් අඩුපාඩු 2015 මැයි 31 දින වන විටත් විසඳා නොතිබුණි.

(අ) ගෘහස්ථව සිටින ඇතින්නක් ගැබ් ගැනීම පිළිබඳව 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධිත) පනතේ 10 හා 22(9) වගන්තිය අනුව අලි පැටවුන්ගේ උපත ලේඛන ගතවී නොතිබුණි. එම පනත්වල විධිවිධාන ප්‍රකාරව හිමිකරුවන් විසින් මියගිය අලි ඇතුන් පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි.

(ආ) ඇතුන් නීති විරෝධී ලෙස කැලයෙන් අල්ලා ලඟ තබාගෙන පසුව ලියාපදිංචි කර බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර තිබුණි.

(ඇ) නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් (රිට් 625/09 නඩුව) හා ආඥා පනත අනුව ද ලියාපදිංචි නොකළ අලි ඇතුන් සන්තකව තබාගෙන ඇති පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු අතර හීලෑ අලි ඇතුන් සම්බන්ධව කටයුතු කිරීමට මාර්ගෝපදේශයන් සැකසිය යුතුව තිබුණි. අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාළව දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර තිබුණු අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය, විශේෂයෙන් ලේඛනවල ආරක්ෂාව සම්බන්ධව ගෙන තිබුණු ක්‍රියාමාර්ග ඉතා දුර්වල තත්ත්වයක තිබුණි. මේ නිසා අලි ඇතුන් ලියාපදිංචිය සටහන් කිරීමට පවත්වාගෙන ගිය ලේඛන 06 ක් අතරින් එක් ලේඛනයක් 2012 වර්ෂයේ සිට අස්ථානගතවී තිබුණි.

(ඇ) අලි ඇතුන් ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදයෙහි දක්නට ලැබුණු දුර්වලතාවයන් හා බලපත්‍ර දිර්ඝ කිරීමේදී දීර්ඝ කළ බවට සහතිකයක් නිකුත්කර නොතිබීම හා ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොතිබුණි.

(ඉ) නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් හග්ගල ඇඩි ස්වභාව රක්ෂිත භූමියෙන් හා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අනවසර ඉඩම් අල්ලා ගැනීම් පිළිවෙලින් 116 ක් හා 103 ක් වාර්තා වී තිබුණි. එම පරිසර සංවේදී ප්‍රදේශවල අනවසර අත්පත්කර ගැනීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2015 අගෝස්තු 31 දිනටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) සීමාසහිත පාරිසරික පදනම විසින් අභියාචනාධිකරණයේදී ගොනුකළ නඩුවකට අදාලව හග්ගල ඇඩි රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් නවතාලීම, අනවසර පදිංචිකරුවන් අධිකරණයට ඉදිරිපත්කර ඉවත් කිරීම, හග්ගල ඇඩි රක්ෂිතයේ මායිම් සලකුණු කිරීම, අනවසර පදිංචිකරුවන් සඳහා විදුලි පහසුකම් ලබා නොදීම, ඇඩි රක්ෂිත ප්‍රදේශයේ අනවසර වගා කටයුතු සඳහා තවදුරටත් බලපත්‍ර නිකුත් කිරීම හෝ දීර්ඝ කිරීම හෝ අළුත් කිරීම අත්හිටුවීම යන නියෝග ක්‍රියාත්මක කිරීමට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාකර නොතිබුණි.

## 4.12 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 23 | 33 |
| (ii) තෘතියික මට්ටම | 32 | 26 | 06 |
| (iii) ද්විතියික මට්ටම | 1,419 | 896 | 523 |
| (iv) ප්‍රාථමික මට්ටම | 468 | 427 | 41 |
| **එකතුව** | **1,975** | **1,372** | **603** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 603 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.